# කවි කොළය

ඩෙන්න ඩෙනා ඩෙන්න ඩෙනෝ
ග්‍රීස් යකා ඔන්න එනෝ
මේ කතාව අහල අහල
මුළු ලෝකෙම හිනා වෙනෝ

වළඳ වගේ කළු පාටයි
ඌ එන්නේ මහ රෑටයි
උපන් ඇඳුම ඇඳගෙන මූ
පිළිකනු ගානේ ගාටයි

ගැටිස්සියන් වෙත නාඹර
බැලුම් හෙළන මුත් කෑදර
ග්‍රීස් යකුගෙ වැඩි මනාපෙ
ආච්චිලාටයි රෑබර

පළමුවරට කහ වත්තේ
ඉන්පසුවට තේ වත්තේ
තැන තැන ඒ වටපිටාවෙ
ප්‍රාණ හතක් බිලි ගත්තේ

ඉර හඳ දෙක උලා කාපු
හමුදාවෙන් පැනලා ආපු
ඇයොත් දැන් අහුවෙලාලු
අත් පා වල ග්‍රීස් ගාපු

ළමිස්සියෝ යති පාරේ
ඒ අය මොහුගෙන් බේරේ
පණහ පැනපු අම්මලාට
වද දෙයි මේ අව තාරේ

ගිනි අවියක් කර පින්නා
ග්‍රීස් යකා ගොස් පන්නා
බේබදු ගොන් තකතිරුවෙක්
දරුවෙකු බිල්ලට දුන්නා

වඩින විටදි දණ ගහලා
මැරුවලු හොඳටම ගහලා
පොලිසියෙ තරුණයෙකි මළේ
රටම හඬයි එය අහලා




දුර දිග හරිහැටි නොබලා
ග්‍රීස් යකුන් යයි කියලා
ගමේ මෝඩ හරක් රැළක්
මැරුවලු දෙන්නෙක් ගහලා

මෙහෙම වැඩක් කිසිම දාක
වුණාද පුදුමයි නෙ මේක
ජවිපෙ ඇයො නම් කියන්නෙ
ආණ්ඩුවෙම වැඩක් මේක!

ප්‍රභාකරන් වත් මැරුවා
රට එකසේසත් කෙරුවා
ඒත් මේකා අල්ලන්නට
හමුදාවටවත් බැරුවා

රාළහාමි කෙනෙක් ජරා
සයිකලයක නැගී හොරා
සොපිනෝන ගෙ කෝපිකඩේ
පිළිකන්නෙන් කොකං කරා

සොපියා මර
හඬ දුන්නා
එසවිණි පොලු
කැති මන්නා
ග්‍රීස් යකා
අමු හෙළුවෙන්
පොලිසියෙ
වත්තට පැන්නා!



♦ තලන්ගම ජයසිංහ Sri Lanka

# සුදු කොඩි කතාව අමූලික බොරුවක්!

## තමිල්චෙල්වම්ගේ බිරිඳ කියයි



**යු**ද්ධයේ අවසාන මොහොතේදී සුදු කොඩි ඔසවාගෙන යටත්වීමට පැමිණි බවත් එසේ පැමිණි කොටි නායකයන් ශ්‍රීලංකා ආරක්ෂක අංශය විසින් ඝාතනය කරන ලද බවට ඉදිරිපත්ව ඇති මත අමූලික බොරු බව කොටි සංවිධානයේ හිටපු දේශපාලන අංශ ප්‍රධානී එස්. පී. තමිල් සෙල්වම්ගේ වැන්දඹු බිරිඳ ශෂිරේඛා ශ්‍රීලංකාවේ නේෂන් සහ රිවිර පුවත්පත් සම්මුඛ සාකච්ඡාවකදී පැහැදිලිවම කියා සිටියා ය. ඔවුන් මියගියේ අවසාන දින කීපයේ හමුදාව සමග පැවති ගැටුම් වලදී බව ඇය අනාවරණය කළා ය.

වෙල්ලමුල්ලවයික්කාල් නම් පෙදෙසේ සීමිත බිම්කඩක තවත් දෙමළ ජනයා සමග කොටුවී සිටි ශෂිරේඛා හමුදා අංශ පාලනය පැවති ප්‍රදේශයට පැමිණියේ 2009 මැයි මස මුලදීය. ඊට පෙර කීපවතාවක් එන්නට තැත් කළත් කොටි සංවිධානය ඔවුන්ට ඉඩදුන්නේ නැත. දෙමළ ඩයස්පෝරාව දැනට ගෙන යන ප්‍රචාරක වැඩ ගැන සිය අදහස් දක්වමින් ඇය කීවේ එම ඩයස්පෝරාව දෙමළ ජනයා විනාශය කරා ගෙනයන බව පැහැදිලිව පෙනෙන බවයි.

ඇය ඉපදුණේ කොළඹ බම්බලපිටියේය. ඇගේ දෙමාපියනට බම්බලපිටියේ හන්දියේ සාප්පුවක් තිබුණේය. ඇය ඉගෙනුම ලැබුවේ ශාන්ත අන්තෝනි බාලිකා විදුහලේය.

1983 කෝලහලවලදී මැරවරයෝ ඇයගේ පියාගේ සාප්පුවට ගිනිතබා විනාශ කළහ. ඒ නිසා පවුලම යාපනයේ පදිංචියට ගියෝය. ඇය එහි වඩුක්කොඩෙයි විදුහලට ඇතුල්කරන ලදුව අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා ඉගෙනුම ලැබුවාය. ඒ අතර භරත නාට්‍ය ශිල්පය හදෑරූ ශෂිරේඛාට අවශ්‍ය වූයේ දක්ෂ නැටුම් ශිල්පිණියක් වීමටය.

ඇයගේ දෙමාපියන් ආපසු බම්බලපිටියට පැමිණියත් ඇය යාපනයේම නැවතුණාය. ඇයත් දෙමාපියන් අතර සම්බන්ධය කැඩුණේය. ඒ අතරේ ඇය එල්ටීටීඊ සංවිධානය කළ රැස්වීම්වල නැටුම් ඉදිරිපත් කළා ය. තමිල් චෙල්වම් මුණගැසුණේ එවැනි අවස්ථාවකදීය. ඔහු හා විවාහ වන්නට කපුකම කරන ලද්දේ ඇන්ටන් බාලසිංහම් විසිනි. විවාහය සිදුව ඇත්තේ හදිසියේය. ඒ බාලසිංහම්ට වකුගඩු රෝගයට ප්‍රතිකාර ගැන්ම සඳහා පිටරට යාමට තිබූ නිසා ය.

තමිල්චෙල්වම්ගේ මරණය සිදුවූ දා ඇයට ගෙදරට පැමිණ ඒ බව දන්වන ලද්දේ කොටි භටයෙකු විසිනි. මිනිය තිබුණු ගෙදරට පසුව ගිය ඇය හඬා වැළපුණාය. එහි පැමිණි ප්‍රභාකරන් ගේ මුහුණද බියට පත්ව තිබූ සැටි ද ශෂිරේඛා පැවසුවා ය.

සිය සැමියාගේ මරණයෙන් පසු තමා කෙරෙහි එල්ටීටීඊ දක්වන සැලකිල්ලේ වෙනසක් ඇයට දැනිණ. තම



දරුවන්ද සමග ඉන්දියාවට යාමට අවශ්‍ය වූ නමුත් සංවිධානය ඉඩ දුන්නේ නැත. හමුදා පාලනය පවතින පෙදෙසට යාමටද කළ ඉල්ලීම ප්‍රතික්ෂෙප විය. කෙසේ හෝ අවසාන දින වල අනෙක් පිරිස් සමග හමුදා ප්‍රදේශයට පැනයන්නට ඇයට හැකි විය. හමුදාව ඒ පැන ආ හැමට ඉතා කාරුණිකව සැලකූ බව ඇය කියයි.

අද තම දරු දෙදෙනාද දෙමාපියන්ද ඇය ළඟය. ශ්‍රීලංකා රජයද හමුදාවද ඉතා හොඳින් ඔවුන්ට සලකන බව ඇය අවධාරණය කරයි. දරුවෝ නිදහසේ අධ්‍යාපන කටයුතු වල යෙදෙති. ඇය ඒගැන ඉතා සතුටු වන්නීය. ඒ බව ඉහත ඡායාරූපයෙන් පැහැදිලිව පෙනේ. ♦ කීර්ති



**ඉරිදා - SUN** මම කඩවත කැතරින් පුංචි අම්මට කතා කළා පුංචි අම්මගෙ දෙවෙනි දුව මනෝරි කෝට්ටෙ අළුත් ඉඩමක් අරං ලොකු ගෙයක් හැදුවා. ගිය මාසෙ ඒකෙ වැඩ ඉවර වෙච්ච ගමන් හාමුදුරුවරු විසිපස් නමකට සාංඝික දානයක් දුන්නයි කිව්වා. මම නිකං කිව්වා හරියට මහන්සි වෙන්න ඇති නේද කියලා. එතකොට කුඩම්මා කියනවා, මොන මහන්සියක්ද දුවේ, හෝටලේකට කෑම ඔඩරේ බාර දුන්නම, හරියට දානෙ වෙලාවට පැය බාගෙකට කලින් වෑන්එකකින් ඇවිත් සේරම කෑම වර්ග ඩිලිවරි කරලා යනවා. ගෙදර අයට තියෙන්නෙ ඒ කෑම හාමුදුරුවරුන්ට පිළිගන්වන එකයි කියලා. අවශ්‍ය සේරම පිඟන් බඩුත් හෝටලෙන්ම ගෙනැත් දෙනවලු. ඉස්සර වගේ මැරීගෙන දානෙ උයන්න ඕන නැත කිව්වා. දැන් ලංකාවෙ හුඟ දෙනෙක් දානෙ දෙන්නෙ එහෙමයිලු. වැඩිය කරදරවෙන්න අවශ්‍ය නැත කිව්වා. මට අහන්න අමතක වුණා, පුංචි අම්මෙ පිං දෙන කොට හාමුදුරුවන්ට කිව්වෙ නැද්ද, හෝටලේ මුදලාලිටයි, කෝකියන්ටත් එක්ක පින් දෙන්න කියලා.

**සඳුදා - MON** කැතරින් පුංචි අම්මලා දානෙ දුන්න හැටි ගැන හිතන කොට මට මතක්වුණා අපේ අම්මලා ගමේ දානෙ දීපු සාම්භීරකමයි ඒ භක්තියයි. දානෙ උයන්නෙ කතා නොකර මුඛවාඩමක් බැඳගෙන. ඒ කියන්නෙ කෙළ වීසිවෙයි කියන බයට. ලුණු ඇඹුල් බලන්න වත් හැන්දකට ඩිංගක් අරන් රහ බලන්නෙ වත් නැහැ. තාත්ත උදෙන්ම නාලා පිරිසිදු සුදු සරමක් කමීසයක් ඇඳලා පන්සලට ගිහිං පෙරහැරෙන් හේවිසි ගගහ ගෙදරට හාමුදුරුවරු වඩම්මගෙන එනවා. තාත්තා ධාතු කරඬුව ඔළුවෙ තියාගෙන හෙමිහිට ඉස්සරහින් එනවා. ලොකු මාමා තමයි පය හෝදන්නෙ. ඒ හැම දෙයක්ම දැන් වෙනස්. බෞද්ධ වත්පිළිවෙත් හැල්ලුවෙලා. නාගරිකවෙලා වාණිජ වෙලා. ලංකාව දැන් හිඟන්නෙකුට රුපියලක් දීලා ඒ පිනෙන් නිවන් යන්න ඇහැකිය කියලා හිතන රටක්.

**කුජදා - TUE** ලන්ඩන් වල ගිය මාසෙ ඇති වෙච්ච කළබල කලකෝලාහල වලට හේතු මොනවද කියලා මෙහේ ආණ්ඩුව විපක්ෂය මාධ්‍යය පූජක පක්ෂය සහ පොලීසිය තවම හොයනවා. ඒ හැමෝම කියන දේවල් එකිනෙකට වෙනස්. හැබැයි ඒ කවුරුවත් ඒ විනාසෙ කරපු ඇයින්ගෙන් ඇහුවෙ නැහැ, ඇයි යකුනේ තොපි අර වගේ පාහර වැඩක් කළේ කියලා. උන් තමයි ඇත්තටම ඒව කරන්න හේතු දන්නෙ. මම හිතන හැටියට ඒ හේතුවලටත් මූලික හේතුවක් තියනවා. ඒ තමයි රටක ලිහිල් නීතියක් තියන බව ඒ රටේ ජීවත්වන මිනිස්සුන්ට වැටහීම. එතකොට නිකම්ම තව හේතු දහස් ගණනක් උපදිනවා. එංගලන්තෙට වුනෙත් ආන්න ඒකයි.

**බුදදා - WED** අද උදේ පාන්දර 4 ට ඇහැඇරිලා මම ඇඳ ළඟ තියන මගේ පුංචි රේඩියෝ එක ඇහෙන නෑහෙන ගාණට දාගන උදේ බර්ක නිවුස් ඇහුවා. එතකොට තමයි මට ඇහුණේ කවුද බ්‍රිටිෂ් එම්පී කෙනෙක් කියනවා, ලිබියාවට පස්සෙ තව හරිගස්සන්න අප්‍රිකාවෙ රටවල් කීපයක් තියනවයි කියලා. යකෝ ඒ කියන්නෙ මේ ගොල්ලනේ මේ රටවල් නිවැරදි කරන්න යන්නෙ. කවුරු දීපු බලයක්ද? තමන්ගෙ රටේ කළකෝලහල. තරුණයො මෙල්ල කරන්න බැහැ, උන් කඩනවා ගිනි තියනවා මංකොල්ලකනවා. එහෙම තියෙද්දි මේ ගොල්ල වෙන රටවල් වලට ඇඟිලි ගහනවා. මම අද අගමැති ඩේවිඩ් කැමරන්ට ඊමේල් එකක් යැව්වා මේ ගැන අහලා. බලමු මොනවද එයා කියන්නෙ කියලා.

**ගුරුදා - THU** අපේ ලංකාවට වැළඳිච්ච අළුත්ම වසංගතේ ග්‍රීස් යක්කු. දැන් එහේ හැමෝම අනික් මිනිස්සු දිහා බලන්නෙ මූද ග්‍රීස් යකා කියන හිතුවිල්ලෙන්. කවුරුහරි රෑට පාරෙදි හම්බ වුනොත් සමහරු යටි ගිරියෙන් කෑ ගහගෙන දුවනවලු මෙන්නෝ මෙතන ග්‍රීස් යකා ඉන්නවෝ කියලා. ඒ පාර කාටහරි අසරණයෙකුට ඉළ ඇට බිඳෙන කල් ගහලා කියන වලු. නෑ මෙයා ග්‍රීස් යකෙක් නෙවෙයි කියලා. එතකොට අර මිනිහා මැරිලා

**කිවිදා - FRI** මම ග්‍රීස් යකා ගැන ලංකාවට කතාකරලා සෝමතුංග බාප්පගෙන් ඇහුවා. බාප්ප කියනවා මාස ගණනකට ඉස්සර මේ උඩරට පළාතක කවුද එකෙක් රෑ ඇඟේ ග්‍රීස් ගාගන ගිහිං ගෙවල් වලට පනින වලු. ග්‍රීස් ගාගන්නෙ ලිස්සන කොට කාටවත් අල්ලන්න බැරි වෙන්නලු. කාගෙ හරි ඇඟක ග්‍රීස් තිබුණොත් එයින් පෙන්නනන්නෙ මෑන් තමයි ග්‍රීස් යකා කියලා. බාප්ප විස්තර කළේ එහෙමයි. ඒ පාර මම බාප්පගෙන් ඇහුව....“ එහෙනම් බාප්පෙ කොළඹ පංචිකාවත්තෙ ස්පෙයාර්පාට් කඩවල, ගරාජ්වල ඉන්න ඔක්කොම ග්‍රීස්යක්කු හැටියට නේද ගණන් ගන්න ඕන....” කියලා. ඇයි ඒවයි වැඩ කරන හැමෝංගෙම ඇඟේ ග්‍රීස් තියනවා නේ. බාප්ප කිව්වා.... “ ඇත්ත තමයි ඒ කතාව.... ඔය පාර මෙහේ ඉන්න ඔල්මාදකාරයො ලංකාවෙ ගැරේජ්වල වැඩකරන බාස්ලට අල්ල ගෙන ගහන්න පටන් ගනීවි හරි වැඩේ තමයි එතකොට වෙන්නෙ....” කියලා.